# මැටිකළය; නිමැවුම, භෞතික හා අභෞතික භාවිතය පිළිබඳ විමර්ශනාත්මක ප්‍රවේශයක්

එච්. ඒ. ඒ. ස්වර්ණා ඉහළගම

*"Kale", "kalagediya" and "Kalaya"* are the Sinhala terms used for the common water pot. When it is called*"meti kalaya"*, it is means that it is made of the raw material clay. *Meti kalya* has been used by Sri Lankans as a continuing tradition serving people since the origin of pottery in the country. The majority of its users were womenfolk and its shape is also suitable to carry water on the hip of a woman while its neck is held by the hollow of the elbow. This paper discusses *meti kalaya* as one of the major vessels in domestic use among Sri Lankan people focusing on different views as to its application in various purposes. The literature survey method is used in collecting the relevant facts to develop the paper. The findings show that, on the one hand, *Meti kalaya* is a useful vessel used for carrying, storing water, and other liquid, and objects. On the other hand, it is used in various religious beliefs and magical practices as a symbolic object.

මොහෙන්දජාරෝ, හරප්පා සහ ඉන්දුනිම්න ශිෂ්ටාචාර ආශ්‍රිත මැටි මෙවලම් භාවිතය පිළිබඳ පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍ය අනුව සනාථ කෙරෙන්නේ ලොව පැරණිතම ශිෂ්ටාචාර ගොඩනැගීමේ දී දියුණු ලක්ෂණ සහිත මැටි කර්මාන්තය ද ප්‍රධාන වශයෙන් ආධාර වූ බව ය. ''පූර්ණ හෝ කැබලි ස්වරූපයේ පැරණි මැටි භාජන අවශිෂ්ට, ඒවා නිපදවූ සහ භාවිත කළ ජනයාගේ ජීවිතය, සංස්කෘතිය හා සම්ප්‍රදාය හඳුනාගැනීමේදී  මහෝපකාරී වේ (De Silva 2008: 7). ඒ, ''වෙනත්

---

© ආචාර්ය එච්. ඒ. ඒ. ස්වර්ණා ඉහළගම

සංස්. ආචාර්ය පූජ්‍ය මීමුරේ ගුණානන්ද හිමි, මහාචාර්ය ඊශා හේවාබෝවල, මහාචාර්ය සුසන්ත මහළුල්පත, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රියංකර රත්නායක

මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 20 කලාපය, 2012/13, මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

ඕනෑම භෞතික සංස්කෘතික අංගයක් මෙන් ම මැටි බඳුන් ද ජනජීවිතය සමග විචිත්‍රවත් ව ගෙත්තම් වී'' (Skibo & Feinman1999: 1) පවතින බැවිනි. මිහිතලයේ හටගැනෙන අපූර්ව පාංශු ප්‍රභේදයක් වන මැටි භාවිතයෙන් දෛනික ජීවන කාර්යයන් පහසු කෙරෙන විවිධ භාණ්ඩ හා මෙවලම් නිපදවා ගැනීමේ හැකියාව පිළිබඳව දුරාතීතයේ සිට ම සිදු කළ අත්හදාබැලීම්, මැටිභාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියෙහි ප්‍රභවයට මෙන් ම වර්ධනයට ද හේතුපාදක වී ඇත.

ශ්‍රී ලංකාවේ මැටි කර්මාන්තයට වර්ෂ 4000ක් තරම් ඈතකට දිවෙන ඉතිහාසයක් පවතින බව දිවයිනේ විවිධ ප්‍රදේශවල සිදු කරන ලද පුරාවිද්‍යාත්මක කැණීම්වලින් හමුවී ඇති මැටි භාණ්ඩ නෂ්ටාවශේෂවලින් සාක්ෂ්‍ය සැපයෙයි. එක් එක් යුගවල මැටි භාණ්ඩ මගින් තත් කර්මාන්තය ආශ්‍රිත භාණ්ඩවල ගුණාත්මකභාවය හා ශිල්පීය ප්‍රවණතා මෙන්ම ඒවායේ කලාත්මක පරිසමාප්තිය, ස්වරූපය, වර්ගය, බෙදාහැරීම, භාවිතය, වෙළෙඳාම හා තාක්ෂණය යනාදී තොරතුරු අනාවරණය කෙරෙයි (De Silva 2008: 12). මෙරට විසූ ආදි සිංහල මනුෂ්‍ය සංහතිය හා වරින් වර සිදු වූ විදෙස් ආක්‍රමණ හා සංක්‍රමණ ඔස්සේ ඔවුන් සමග සම්මිශ්‍රණය වූ කාර්මිකයන් යන දෙකොටසේ සංකලනයෙන් ලක්දිව විසූ කාර්මික පැලැන්තිය ගොඩනැගුණු බව තහවුරු කරන ආනන්ද කුමාරස්වාමි කුඹලුන්, පෙහෙරුන්, පැදුරු වියන්නන් වැනි කාර්මිකයන් සිංහල ජන සංහතියෙහි නියම කොටසක් පිළිබිඹු කරන බවත් ඇතැම් විට ඔවුන් සිංහල සංක්‍රමණයට පෙර මෙහි විසූ කිසිසේත් අශිෂ්ට නොවූ මනුෂ්‍ය වර්ගයාගේ ඉපැරණි සම්ප්‍රදායයන් අනුගමනය කරනු විය හැකි බවත් පවසයි (1962: 62). මෙරටට ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවන විට ද කුඹල්කරුවන් පැමිණ තිබේ (මහාවංසය 1957:17). ඔවුන් කුල අටකින් යුක්ත වූ බව ද සඳහන් ය (සිංහල බෝධිවංශය 1970:180).

මැටි කර්මාන්තය හැඳින්වීම සඳහා 'කුඹල් කර්මාන්තය' යන නම යෙදී ඇත්තේ 'කුම්භ' යන යෙදුම මුල් කරගෙන ය. 'කුම්භ' යනු කළගෙඩිය යන අර්ථය දෙන්නක් බැවින් සමස්ත මැටි කර්මාන්තයට ඒ නාමය ව්‍යවහාර කිරීමෙන් විශද කෙරෙන්නේ, කළය සියලු මැටිභාණ්ඩ අතුරින් ප්‍රමුඛ තැනෙකලා සැලකුණු බව ය. පැරණි සාහිත්‍යකරුවන් 'කුම්භකාරයා' (සිංහල මිලින්ද ප්‍රශ්නය 1970:62) යන්න

භාවිත කර ඇත්තේ කුඹල්කරුවා යන අර්ථයෙනි. කුඹල්ගෙය හැඳින්වීමට 'කුඹල්හල', මැටිබඳුන් පුළුස්සන උදුන හැඳින්වීමට 'කුඹල් උදුන' යනාදී යෙදුම් මෙන් ම කෝටුවකින් කරකවන ලද චක්‍රයක් සහ මැටි මත සැරසිලි සඳහා ඉරි ආදිය ඇඳීමට භාවිත කටු වැනි කුඹල් කර්මාන්තයට අදාළ කරුණු **විසුද්ධි මාර්ග සන්නයේ** ඇතුළත් වේ (ධම්මරතන හිමි 1880: 326). එහි සඳහන් චක්‍රය කුඹල්කරුවන් මැටිබඳුන් සෑදීමට භාවිත කරන ප්‍රධාන මෙවලම වූ සකපෝරුව විය යුතු ය. 'කුඹල් සක්' (ධම්පියා අටුවා ගැටපදය: 1932, 205) නමින් ඇතැම් සාහිත්‍ය කෘතිවල හැඳින්වෙනුයේ එය යි.

ශ්‍රී ලංකාවේ කුඹල් කර්මාන්තය පැවතෙන්නේ ඊට විශේෂිත වූ කුල ස්තරයක් කේන්ද්‍රීය ව ය. මෙරට කුල පද්ධතියෙහි ව්‍යුහය, වෘත්තීය හා චාරිත්‍රානුකූල ස්වාමිත්වය පිළිබඳ වූ බලවත් සම්ප්‍රදායයන්ගෙන් සමන්විත වන බැවින් කර්මාන්තයන්හි වෙනස්කම් පදනම් කොට ගෙන කුල භේදය දියුණු වූ බව ඇතැමුන්ගේ අදහසයි (Ryon:1952,189). සාමාන්‍යයෙන් මැටි කාර්මිකයන් 'කුඹලුන්' වශයෙන් හැඳින්වුණ ද ඔවුන් අයත් කුලය 'බඩහැල' නම් විය. ලාංකේය කුල පද්ධතිය පිළිබඳ විග්‍රහ කෙරෙන **ජනවංශයට** අනුව මැටි කාර්මිකයන්ට 'කුඹල්' නාමය ලැබී ඇත්තේ මැටි ගෙන මැද සිදුරුකොට කළ, කොතලා, සැලි, තාලි තනන හෙයිනි. එසේ ම ඔවුන් උළු වළං ආදිය නුවණින් කරන හෙයින්, පණ්ඩිතයා යන නම ද, සාලා තනා එහි උළු වළං දවා පුළුස්සන හෙයින් බඩහැලයා යන නම ද ලැබී ඇතැයි පැවසේ (ආරියපාල සහ තවත් අය 2003:71). සිංහල කුලක්‍රමය පූර්වත්වය කිසිදු ලෙසකින් වෙනස් කළ නොහැකි අනුක්‍රමයකට අනුව ඒ ඒ කුල වර්ග කරන ලද, නිශ්චිතව හා පැහැදිලිව නිරූපිත ස්ථාවර ධූරාවලියක් නොවීය (පීරිස්: 1964, 188). නමුත් පහත් තත්ත්වයේලා සැලකුණු කුල අතර බඩහැල කුලය ද විය. උඩුකය වසා ඇඳුම් ඇඳීමට හා පුටුවල වාඩිවීමට හෝ එක්ව අනුභව කිරීමට හෝ ඔවුනට හිමිකමක් නොවූ නමුත් උසස් යයි සම්මත කුලයකට අයත් නිවසක දී අවශ්‍ය වුවහොත්, කෙමිය සහිත කොතලයකින් ජලය මුවට වත් කරගෙන පානය කිරීමේ වරප්‍රසාදය හිමි විය. කෙමිය සහිත කොතල මුලින් නිපදවා ඇත්තේ කුඹල්කරුවන්ගේ ප්‍රයෝජනයට පමණක් වූ නිසා, කෙමිය රහිත කොතලවලින් දිය බීම අපහසු වූ උසස් කුලීනයන් විසින්

තමන්ට ද ඒ වර්ගයේ කොතල තනා දෙන ලෙස කරන ලද ඉල්ලීම ඉටුකිරීම වෙනුවෙන් ඒ වරප්‍රසාදය ප්‍රදානය කෙරුණු බව කියැවේ (කරුණාරත්නඃ 2008, 212).

සීගිරිය ආශ්‍රිත පුරාවිද්‍යා කැණීම්වලින් මෑතක දී සොයා ගැනුණු මැටිකළය, ශ්‍රී ලංකාවේ පෞරාණික මැටි කර්මාන්තයේ ස්වරූපය සම්බන්ධයෙන් වැදගත් සාධකයකි. සීගිරිය උතුරු ප්‍රදේශයේ ඇතුළු දිය අගලෙහි සිදු කෙරුණු කැණීම්වල දී මෙය සොයා ගැනුණේ 2013 නොවැම්බර් පළමු වැනිදා ය (දිවයින 2014-01-19). පොළොව මතුපිට සිට මීටර් 4ක් පමණ අභ්‍යන්තරයට වන්නට තිබී ඇති මෙය පැරණි මැටිකළයේ ස්වරූපය පිළිබඳ තථ්‍යාකාර අවබෝධයක් ලබා දෙයි. මානවයාගේ නිර්මාණ ශක්තිය පිළිබඳ ඉහළ ම නිදසුනක් (Child 1956:93) සේ සැලකෙන කළය, ජලය ප්‍රවාහනය හා රැස් කර තැබීම සඳහා ප්‍රධාන වශයෙන් භාවිතයට ගැනුණ ද, විවිධ ද්‍රව හා ද්‍රව්‍ය වර්ග බහාලීම පිණිස ද භාවිත වී තිබේ. අනෙක් අතට චාරිත්‍ර, ඇදහිලි විශ්වාස, ශාන්තිකර්ම, විනෝදාත්මක කටයුතු වැනි කාර්යයන්හි දී ද අභෞතික වශයෙන් භාවිතයට ගැනේ. පැල්පතේ පමණක් නොව රාජරාජමහාමාත්‍යාදීන්ගේ මන්දිරවල ද අත්‍යවශ්‍ය ම භාණ්ඩයක් වූ කළය, ඒ ඒ සමාජ ස්තරවලට ගැළපෙන ආකාරයෙන් භාවිතයට ගෙන ඇත. භෞතික වශයෙන් මෙන් ම අභෞතික වශයෙන් ද ප්‍රයෝජනයට ගැනුණු කළය ජනජීවිතය සමග දැඩි සම්බන්ධතාවක් දක්වයි.

**කළයේ භෞතික භාවිතය**

කළය, වර්තමානයේ පවා බොහෝ ගැමි නිවෙස්වල පමණක් නොව නාගරික නිවෙස්වල ද භාවිතයට ගැනෙන සාම්ප්‍රදායික භාණ්ඩයකි. එහි භෞතික ප්‍රයෝජන අතර ප්‍රමුඛ වන්නේ ජලය සම්බන්ධ ගෘහස්ත කටයුතුවල දී ඉන් සැලසෙන දායකත්වය ය. එපමණක් නොව හේන් හා ගෙවතුවගා කටයුතුවල දී බෝගවලට ජලය සැපයීම සඳහාත් ධාන්‍ය වර්ග, තෙල් වර්ග, පාන වර්ග හා වෙනත් දෑ ආරක්ෂා කරගැනීම හා කල්තබාගැනීම සඳහාත් කළය භෞතික වශයෙන් ප්‍රයෝජනවත් විය. කළයෙහි හැඩය සකස් වී ඇත්තේ එහි ගැටිය අතෙහි වැලමිටි නැම්මෙන් රඳවාගෙන උකුළෙහි තබාගෙන ජලය රැගෙන යා හැකි පරිද්දෙනි (De Silva 2008:23).

සීගිරිය ආශ්‍රිත ව සිදු කළ කැණීම්වලින් සොයා ගන්නා ලද මැටිකළය ඊට හොඳ ම නිදසුන ය. එහි කට, අනෙකුත් කළවලට වඩා අඟල් හත අටක් උස ය. එසේ තනා ඇත්තේ කාන්තාවන්ගේ උකුලේ රඳවා සුරක්ෂිත ව අල්ලාගෙන යෑම සඳහා ය (දිවයින 2014-01-19). ඒ අනුව කළය සාමාන්‍යයෙන් කට කුඩා, කර සිහින් හා බඳ විශාල බඳුනක් වුව ද, එය භාවිත කෙරෙන කාර්යය හා ස්ථානය අනුව හැඩය හා අලංකරණය විවිධ ස්වරූප ගෙන ඇත. එහි ප්‍රාරම්භක අවස්ථාවේ හැඩය පිළිබඳ නිශ්චය කිරීම අසීරු වුව ද, එය මිනිස් හස්තයට ගැනුණු මැටි පිඩකින් වැඩිදුරට නොසිතා සකසා ගැනුණු රළු භාජනයක් වන්නට ඇත. අනතුරුව සකපෝරුව හා පෝරණු වැනි දියුණු තාක්ෂණික ක්‍රමෝපායයන් අනුගමනය කිරීම හේතුවෙන් එම ක්‍රියාවලිය වඩවඩාත් ප්‍රගුණ කොට කිසියම් නිර්මාණාත්මක හා කලාත්මක ස්වරූපයකට හැඩගසා ගැනීමට සමත් වන්නට ඇත. කළය නිර්මාණය කිරීමට උපයෝගී කරගත් ආකෘතිය, ජලය රැස්කර තබා ගැනීමට හා රැගෙන යාමට භාවිත කෙරුණු ලබුකැටයේ හැඩය බවට සැක නැත. ලබු, පුහුල්, සත්ත්ව මුත්‍රාශ, තුනී සිවි, සම්, වැල් සහ කෝටු ආදියෙන් තනන ලද පූර්වකාලීන ප්‍රාථමික භාජන (Child 1956: 93) මැටිභාණ්ඩවල හැඩතල සඳහා ආදර්ශ කොට ගෙන ඇත. කුඹල් කර්මාන්තය පිළිබඳ මනා අවබෝධයක් නොමැතිව සිටි කාලයෙහි ඕස්ට්‍රේලියානුවන් විසින් භාවිත කරන ලද, වෙනිගසා තනා ගන්නා ලද භාජන විශේෂවල හැඩය ද, කුඹල් කර්මාන්තය ඇරැඹීමෙන් පසුව නිපදවන ලද මැටි භාජනවලට ආදේශ කරනු ලැබ තිබේ (G.Plekhanov: 1981,352). ලබුකැටයේ හැඩය කළය නිර්මාණය සඳහා යොදා ගැනුණු බව 'ලබු කළය' (Ancient Ceylon 1970: 171, Silva 2004:5) නමින් ලබුකැටය හැඳින්වීමෙන් ද පැහැදිලි වේ. වර්තමානයේ පවා ඈත ගම්මානවල මෙය භාවිත කෙරෙනු දැකිය හැකි ය. එළවළු කොටුවලට ජලය යෙදීම සඳහා භාවිත කෙරෙන 'කොරටු කළය' නම් කළ විශේෂය ලබුකැටයේ හැඩයට අතිශය සමීප ය. මෙය සිහින් බඳකින් හා කුඩා මුවකින් යුක්ත දකුම්කලු අණ්ඩාකාර භාජනයකි (De Silva 2008:23). හේන් ගොවිතැනේ දී විශේෂයෙන් ම වගා කෙරුණු බෝගයක් වූ ලබු ගෙඩියේ මද ඉවත් කොට වියළා සකස් කරගැනුණු 'ලබුකැටය' ගොවිතැන් කටයුතුවලට, දඩයමට හා මී කැඩීමට වනයට යනවිට

දිය රැගෙන යාමට මෙන් ම මුළුතැන්ගෙවල ලුණු ආදී යම් යම් ද්‍රව්‍ය දමා තැබීමට ද භාවිත කළ කළයට විකල්ප මෙවලමකි;

ලබ්බ හොඳයි හේනට දිය ගෙන එන් න
ලබ්බ හොඳයිලා අතරෙදි හොදි කන් න
ලබ්බ හොඳයි විටකදි බඩු පුරවන් න
ලබ්බ හොඳයි දඬුවැට ළඟ හිටවන් න
(පියසේන 1994:141)

මී පැණි, බඹර පැණි හා විවිධ තෙල් වර්ග ආරක්ෂා කර තබාගැනීමටත් මස් වර්ග මීපැණියෙහි බහා නරක් නොවී කල්තබාගැනීමටත් ලබු කැටය උපයෝගී කරගැනිණි. ලබු කැටයකට මීපැණි පුරවා ගැනීමේ සිද්ධියක් ජනකතාවක ද සඳහන් වේ (ගුණසෝම 1992:26). ගලා යන ඇළකින්, දොළකින් නැතිනම් ස්වාභාවික ව හෝ සාදාගත් දිය වළකින් ජලය නිවෙසට රැගෙන ගොස් ගබඩා කොට තබාගැනීමේ ප්‍රධාන ආධාරක භාණ්ඩය වෙමින් කළය ප්‍රධාන වශයෙන් ජනජීවිතය සමග අවියෝජනීය ව බද්ධ වී පැවතිණි. ''පානීය පරිභෝජනීය ඝටෙ...'' (විමලකීර්ති හිමි හා සෝමින්ද හිමි 1960: 290) යනුවෙන් **ධම්පියා අටුවා ගැටපදයේ** සඳහන් වන්නේ 'බීම පිණිස ජලය සහ අනුභව කිරීම සඳහා ආහාර රැස්කර තැබූ කළය' යන අර්ථයෙනි. ගැමි නිවෙසක අත්‍යවශ්‍ය ම භාණ්ඩයක් වන කළගෙඩිය බිඳුණ විට ඒ සඳහා වෙනත් ආදේශකයක් නොමැති බවත් ඒ අඩුව පිරිමසාලිය හැක්කේ තවත් කළගෙඩියකට ම පමණක් බවත් ජනකවියකින් පැවසෙයි;

ඉලන්දාරි දෙන්නෙක් මට කළ හදිය
ඇරන් කළගෙඩිය ළිඳ ළඟ අත හැරිය
උයන් කන හැලියෙ දිය බොන්නත් බැරිය
ඇරන් දියත් දොරගාවින් කළ ගෙඩිය
(වලිසුන්දර 1973:13)

අනාදිමත් කාලයක පටන් එදිනෙදා පරිහරණය උදෙසා ලාංකේය ජනයා භාවිත කළ උපකරණ හා මෙවලම් අතරට කළය ද අයත් වන බවට සාහිත්‍ය මූලාශ්‍රයන්ගෙන් සාක්ෂ්‍ය හමුවේ. ''එක් උදක පිරූ කළයක්'' (ධම්පියා අටුවා ගැටපදය 1960: 26), 'කළක්', (අමාවතුර 1953: 48, 235), 'කළය' (බුත්සරණ 1953: 90), 'චිත්තඝටෝ' (ජාතක අටුවා ගැටපදය 1961: 120) යනාදි තැන් ඊට නිදර්ශන සේ දැක්විය

හැකි ය. මූලික මානව අවශ්‍යතාවක් වන ජලය සපයාගැනීමේ කාර්යයේ දී ජලය, අවශ්‍ය තැනෙකට රැගෙන යාමට හා රැස්කර තබා ගැනීමට කළය ප්‍රධාන වශයෙන් ප්‍රයෝජනවත් විය. එසේ ම කිරි, තෙල්, පැණි, රා වැනි ද්‍රව වර්ග ද ධාන්‍ය, කොළ, මිනී අළු වැනි විවිධ ද්‍රව්‍ය බහාලීමට ද කළය ප්‍රයෝජනයට ගෙන ඇත. මේ ආකාරයට ස්වකීය ජීවිතය හා බැඳුණු විවිධ අවශ්‍යතා පූරණය කරගැනීමේ දී පැරැන්නන් කළය භාවිත කර ඇති අවස්ථා කළයේ භෞතික භාවිතය යටතට අයත් කළ හැකි ය.

ස්වකීය ජල අවශ්‍යතාව සපුරා ගැනීමේ දී කළයෙන් විපුල ඵල නෙළා ගත්තෝ කාන්තාවෝ වෙති. ''ගැහැණුන් බෝවේ-කළගෙඩි වේලේ'' (Senevirathna 1936: 105) යන පිරුළෙන් කියැවෙන්නේ ජලය රැගෙන ඒම සඳහා කළගෙඩි රැගෙන යන කාන්තාවන් කිහිප දෙනෙකු එක් වූ විටෙක ඔවුන් කතාබහ කිරීමට කාලය වැය කිරීම හේතුවෙන් දිය ගෙන ඒමේ කාර්යය අතපසු වන බව ය. එසේ හැසිරීම නොහොබිනා ක්‍රියාවක් සේ සැලකුණු බැවින් ''කළේ අරන් ළිඳ ළඟ ගොස් හිඳිනු එපා...'' (ගමගේ 1986:126) යන අවවාදය කාන්තාවන්ට නිතර ලැබී ඇත. ''පිරුණු කළේ දිය හෙල්ලෙන්නේ නැහැ'', ''අඩු කළේ දිය සෙලවෙයි'' (Senevirathna 1936: 121,161) යන පිරුළු මගින් ප්‍රකාශ කෙරෙන්නේ උගත්කමින්, සමාජ අත්දැකීමෙන් හා මානුෂීය ගුණ ධර්මයෙන් පොහොසත්, නොසැලෙන ගුණයෙන් හා අවංකභාවයෙන් යුක්ත පුද්ගලයන් දිය පිරුණු කළයක් මෙන් කිසිවකින් චංචල භාවයට පත් නොවන බව ය; එවැනි ගුණාංගවලින් තොර පුද්ගලයන් සුලු දෙයින් පවා කම්පනයට පත්වන බව ය. දිය පිරුණු කළය සුභ සංකේතයක් ලෙසත් හිස් කළය අසුභ සංකේතයක් ලෙසත් සැලකීම ද සිංහල ජන සමාජයේ ලක්ෂණයකි;

පෙරමග කිරි වතුර මී රා කළ ගෙඩිය
හමුවූ විටෙක යන ගමනෙහි පල වැඩිය
හිස් කළගෙඩිය බිඳලයි ගමනෙහි එඩිය
එන එක හොඳයි ආපසු යනවට වැඩිය
(චන්දන හිමි 1992: 34)

කළය උකුළේ තබා ගෙන දියට යන තරුණ ළඳකගේ දසුන අතිශය සුන්දර විය. කවටයකු මෙන් ම කවියකු වශයෙන් ද ප්‍රකට අන්දරේගේ සිත, එවැනි ළඳකගේ දසුනින් උමතු වූ ආකාරය එක්තරා පද්‍යයකින් කියැවේ;

උකුලේ කළේ තැබූ අඟනක් දැක නෙතට
විකලේ කෙළේ මසිත ද පෙරළී නොපිට
(පතිරණ 1990: 22)

ජලය පිරවීමට හා පිටතට ගැනීමට සකස් කෙරුණු කුඩා විවරයකින් ද විශාල බඳකින් ද යුක්ත ව සමමිතික ව නිමැවුණු කළය මගින් වර්තමානයේ ශීතකරණයකින් යාන්ත්‍රික ව ඉටු කරගැනෙන ජලය සිසිල් කරගැනීමේ කාර්යය ඉටු කරගැනීමට ගැමියා සමත් විය. එසේ ස්වාභාවිකව සිසිල් කරගැනුණු ජලය පානය කිරීම සෞඛ්‍යයට හිතකර විය. කළයට ජලය පිරවූ පසු එහි කට පොල්කටුවකින් වැසීමෙන් ජලය සිසිල් වීම ඉක්මන් වීමත් සිසිල් බව රඳා පැවතීමත් සිදු විය. වර්තමානයේ භාවිත කෙරෙන ලෝහ, වීදුරු, ප්ලාස්ටික් වැනි අමුද්‍රව්‍යවලින් නිපදවෙන බඳුනකට වඩා අවට පරිසරයෙන් ලැබුණු පොල්කටුව සරල ගැමි ජීවිතය හා මනාව ගැළපිණි. කළයේ සිසිල් වූ දිය පොදක් පොල්කටුවට ගෙන පානය කරන විට එය වඩාත් රසවත් විය.

එසේ ම ජල පවිත්‍රකරණ ක්‍රියාවලිය ද කළය මගින් සිදු විය. කළයට පිරවූ ජලයෙහි පවත්නා සියුම් මඬ, රොඩු, වැලි ආදිය එහි පතුලෙහි තැන්පත් වන්නේ එහි හැඩය අනුව ය. දින කිහිපයක් තිස්සේ කළය තුළ ජලය පවතින විට පතුලෙහි එකතුවන සියුම් ද්‍රව්‍ය 'මණ්ඩි' ලෙස හඳුන්වා තිබේ. මේවා දේශීය වෛද්‍යක්‍රමයේ වටිනා ඖෂධයක් වශයෙන් භාවිත කර ඇත. ගැමිලිය විසින් රාත්‍රියට ලිග්ගල් මත කළය මුණින් නමා තැබීමෙන් තෙත් ස්වභාවය පහව යෑමත් විෂබීජ විනාශ වීමත් සිදු විය.

රා මැදීමේ කර්මාන්තය සමග ද කළය සම්බන්ධ විය. කිතුල් සහ පොල් ශාකවල මල් පදම් කොට ඉන් වැගිරෙන ශ්‍රාවය ලබාගැනීමට මුලදී ලබුකැටය භාවිත වුවත් පසුව කුඩා ප්‍රමාණයේ මැටි බඳුනක් භාවිතයට පැමිණ ඇත. විශේෂයෙන් ම කළය භාවිත කෙරුණේ රා

රැස්කර තබාගැනීම සඳහා ය. ''ඒ ඒ තන්හි තියුණු වූ රා පිරූ කළ කොතල මහසැල බඳුන් බඳුන් ආදිය තබ්බවා...'' (ධර්මකීර්ති හිමි 1954:520), ''මෙතෙක් දවස් රා අට කළයක් බොන නාලාගිරි නම් ඇතු රා සොළොස් කළයක් පොවා මත් කරවා විහිදුවූය...'' (ඤාණවිමල හිමි 1971:183) වැනි යෙදුම් පැරණි සාහිත්‍යකෘතිවල අන්තර්ගතවීමෙන් රා මැදීමේ කර්මාන්තය සමග කළය දක්වන සබඳතාව පැහැදිලි වේ.

තෙල්, පැණි හා වෙනත් ද්‍රව වර්ග බහා තැබීමට ද කළය භෞතික වශයෙන් ප්‍රයෝජන සැලසී ය. එවැනි ද්‍රව්‍ය අවට වාතය සමග නොගැටී නරක් නොවී තබාගැනීමට කළයේ හැඩය මනාව ගැළපුණි. කළය එවැනි අවශ්‍යතා සඳහා භාවිත අවස්ථා ද සාහිත්‍යයේ හමුවේ. ''මේ කළය තෙල් පිරුණැයි කියාත් නොසිතව. නැවත තලතෙල් ආදියෙනුත් පිරුණේ නොවෙයි. උක්පැණින් පිරුණේත් නොවෙයි. මීයෙන් පිරුණේත් නොවෙයි. එසේ හෙයින් මේ යහපත් දෙයෙකැයි නොසිතව. මේ කළයෙහි පිරුණු සුරා ආදියෙහි දෝෂ අසවයි...'' (ජිනාලංකාර 1927:1074). දේශීය වෙදකමේ අනගි ඔසුවක් සේ ම ප්‍රණීත ආහාරයක් වශයෙන් ද විශේෂ ස්ථානයක් ගන්නා මීපැණි නරක් නොවී දිගුකලක් තබාගැනීමට ද කළය ප්‍රයෝජනයට ගැනිණි. **සද්ධර්මාලංකාරයේ** ''පිළිහුන් වෙළඳාණෝ පසේ බුදුන් දැක වහා හුනස්නෙන් නැගී පෙරමගට අවුත් පසඟ පිහිටුවා වැඳ අතින් පාත්‍රය ගෙන වලයාධාරයක තබා මී කළයක් ගෙනවුත් පාත්‍රයෙහි වත්කරන්නාහු...'' (ධර්මකීර්ති හිමි 1954:329) යන පාඨයෙන් මීපැණි දමන ලද කළයක් පිළිබඳව කියැවේ.

විවිධ අවශ්‍යතා සඳහා පැරැන්නෝ බහුල ව තෙල් වර්ග භාවිත කළහ. දේශීය වෙදකමේ දී තෙල්වර්ගවලට ප්‍රමුඛ තැනක් ලැබිණි. ආලෝකකරණ කටයුතුවල දී ද තෙල්වර්ග භාවිත විය. එවැනි තෙල් වර්ග බහා තැබීමට කළය උපයෝගී කරගැනිණි. රාත්‍රී කාලයේ පැවැත්වෙන පොදු හා පෞද්ගලික උත්සව, පින්කම් අවස්ථාවල දී ආලෝකය සපයා ගැනීමට තෙල් අවශ්‍ය විය. තිල්වලා ගඟබඩ පවත්වන ලද ගංගාරෝහණ පූජෝත්සවයේ දී පොල්තෙල් දැමීමටත්, ඒ පිංකම් භූමිය අලංකාර කිරීම සඳහා නොයෙකුත් මල්වර්ග බහාලීමටත් නැවුම් මැටි කළ මෙන් ම රන් කළ ද භාවිත කළ ආකාරය **ගංගාරෝහණ වර්ණනාව** කෘතියෙහි විස්තර වේ;

මල්කත් අරන් වහවහා සතුටින් දුවන්නෝ
පොල්තෙල් පිරූ කළ බඳුන් ගොන ගොස් තබන්නෝ...

සදා රන් කුඹු පොල්මලින් සුදු නිමල්
රත්නිල් වැරැල්ලෙන් සරා

(කුමාරතුංග 1963:7,4,5)

කෘෂිකාර්මික ජීවන ක්‍රමය තුළ ධාන්‍ය වර්ග නරක් නොවී දිගුකලක් තබාගැනීමට කළය ප්‍රයෝජනයට ගෙන තිබේ. සහල්, තල, මුං, කුරක්කන් ආදී නොයෙකුත් ධාන්‍ය වර්ග කළවල බහා දිගුකලක් තබාගැනීමට හැකි වී ඇත. අද පවා ගැමි නිවෙස්වල සහල් දැමූ කළ දැකිය හැකි ය.

ගැමි සමාජයේ විශේෂ කාර්යයන් සඳහා භාවිත කෙරුණු බුලත් කොළ රැස්කර තබාගැනීමට ද කළය භාවිත කොට ඇත (සිංහල විශ්වකෝෂය 453). බුලත් විට සඳහා ගැනෙන පුවක් ගෙඩි කළයකට දමා ඊට ජලය එක්කර කට වසා තැබීමෙන් ඒවා සෑහෙන කාලයක් අමු තත්වයෙන් තබා ගත හැකි විය. එසේ තබා ගැනෙන පුවක් 'මඬපුවක්' නමින් හැඳින්විණි. වර්තමානයේ පවා පුවක් වගාව පවතින ප්‍රදේශවල මේ ක්‍රියාව සිදුවනු දැකිය හැකි ය.

කළය දිගුකලක් ප්‍රයෝජනයට ගෙන පරණ වූ පසු හෝ ඉරි තැලී සිදුරු වී ගිය පසු පවා ප්‍රයෝජනයට ගෙන තිබීම විශේෂ කරුණකි. සිදුරු වූ හෝ ඉරි තැලුණු හෝ තැන්වලට කොස්ගෙඩියෙන් ලබා ගැනෙන 'කොහොල්ලෑ' භාවිත කොට, රෙදි කැබැල්ලක් ඇලවීමෙන් පසු නැවත ප්‍රයෝජනයට ගැනීමට ගැමියෝ පුරුදුව සිටියහ. වර්තමානයේ පවා මී මැස්සන් ඇති කිරීම සඳහා එවැනි පිරියම් කරන ලද කළගෙඩි භාවිත කෙරෙන අවස්ථා දැකිය හැකි ය. මී මැස්සන් කුමන තැනක මී බැඳීම කළත් මී පැණිවල ගුණාත්මකභාවයෙහි වෙනසක් නොවන බව පැවසෙන ජනකවියක මැටි කළයක බැඳි මීයක් පිළිබඳව ද සඳහන් වේ;

රන්කළ ගෙඩියේ බැන්දත් මී රස
මැටිකළ ගෙඩියේ බැන්දත් මී රස
ගල් අරණේ බැඳි මීයත් එම රස
කදුරු ගසේ බැඳි මීයත් එම රස

(මහවැලි වංශය 1985:636-637)

මී මැසි ජනපදයක් නිවසේ පවත්වාගැනීමට ගැමියන් විශේෂ කැමැත්තක් දක්වා ඇත. ඊට හේතුව එවැනි මීයක් තිබීම ඒ ගෙදර සෞභාග්‍යයට හේතු වන බව විශ්වාස කිරීම ය (චන්දන හිමි 1992: 83).

**කළයෙහි අභෞතික භාවිතය**

බුදුන් වහන්සේ විසින් ස්වකීය ධර්මය ලෝක සත්ත්වයන්ට දායාද කරනු ලැබූයේ, මනු සතුන් මිථ්‍යා ඇදහිලි විශ්වාසවලින් දුරස් කොට, බුද්ධිය වර්ධනයෙන් ආධ්‍යාත්මික විමුක්තියට මග පෙන්වා දෙමිනි. එහෙත් විවිධ ඇදහිලි විශ්වාසවලින් බැහැර වීම ලාංකේය ජනයාට එතරම් පහසු කාර්යයක් නො වී ය. බුදුන්, දෙවියන් හා යක්ෂ භූතාදීන් ඔවුන්ගේ ජීවිතය හා දෘඪතර ව සම්බන්ධ විය. ඒ අනුව බුදුන් අගතැන්හි තබා කෙමෙන් පහළට විහිදෙන දේව, යක්ෂ සමූහයක් සම්බන්ධිත ඇදහිලි විශ්වාස පද්ධතියක් ඔවුහු ගොඩ නඟා ගත්හ. ''පරලොව ඇති වන දෙයට වඩා මෙලොව සැපසම්පත් දියුණු කරගැනීමට බලි-තොවිල්, මන්ත්‍ර ගුරුකම් ආදිය හේතුවන බැවින් බෞද්ධයාගේ සිත් ඒවාට නැඹුරු වී ඇත''(විජේසේකර 1960:203). මේ නිසා බුදුන් උදෙසා කෙරුණු පුද පූජාදිය මෙන් ම දේව, යක්ෂ ප්‍රේත ආදී අදෘශ්‍යමාන බලවේග මුල් කරගත් විවිධ ශාන්තිකර්ම රාශියක් සිංහල ජන සමාජය තුළ ස්ථාපිත වී ඇත්තේ මේ නිසා ය. කළයෙහි අභෞතික භාවිතය හැඳිනගත හැක්කේ එවැනි පුදපූජා හා ශාන්තිකර්මවල දී එය භාවිත කෙරෙන ආකාරය අනුව ය.

බෞද්ධ ජනයාගේ උතුම් පුණ්‍ය කර්මයක් ලෙස මෙන් ම ශාන්තිකර්මයක් ලෙස ද පවත්වන පිරිත් දේශනය පුද්ගලික හා සමාජ ජීවිතයේ විවිධ වැදගත් අවස්ථා අරභයා සිදු කිරීම වර්තමානයේ පවා දැකිය හැකි ය. තුන්වරු, තිස් පැ, තුන්තිස් පැ, සත්දින ආදි වශයෙන් ඒ ඒ අවස්ථාවට උචිත පරිදි විවිධ ස්වරූප ගැනෙන පිරිත් දේශනා, භික්ෂූන් වහන්සේලා පමණක් නොව ගිහි පිරිස් විසින් ද පැවැත්වීම සිරිත ය. පිරිත් දේශනාවක දී, එය පවත්වන භික්ෂූන්වහන්සේලා හෝ ගිහි කණ්ඩායම හෝ අසුන් ගන්නේ විශේෂයෙන් නිර්මාණය කෙරෙන 'පිරිත් මණ්ඩපය' තුළ ය. එය තැනීමේදී ''සධාතුක කරඬුව වඩා හිඳුවීම සඳහා බුද්ධාසනයක් ද

මණ්ඩපය මැද ඉන්ද්‍රකීලය ද තනා, උඩු වියන්, මලලොඹු, පුන් කලස් ආදියෙනුදු මණ්ඩපය සැරසිය යුතු ය.....නා කිනිති, පුවක් මල්, ලද පස්මල්, සඳුන්, කපුරු, පුවක් ගොබ, තැඹිලි මල් ආදිය, මණ්ඩපයට අවශ්‍ය ද්‍රව්‍යයි. පිරිත් පැන්, නූල් ආදිය ද සැපැයිය යුතු ය (සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව2002:35). මේ පිරිත් මණ්ඩපය තුළට නැවුම් දිය පිරි කළය අනිවාර්ය අංගයක් වශයෙන් ප්‍රවිෂ්ට වන්නේ පාරිශුද්ධත්වය හා පූජනීයත්වය සංකේතවත් කරමිනි. පිරිත් දේශනය ආරම්භයට තුන්වරුවකට පෙර භාරාගත් නොඉඳුල් වළකින් හෝ ළිඳකින් හෝ ලබාගැනෙන ජලය පිරිසුදු රෙදි කඩකින් පෙරා නැවුම් මැටි කළයකට පුරවා ඊට සඳුන් හා සමන් පිච්ච මල් දැමීම සිරිත ය. මේ ජලයට පිරිත් දේශනයේ ආනුභාවයෙන් විශේෂ බලයක් ලැබෙන බව විශ්වාස කරන ජනයා එය ශුද්ධ ජලය වශයෙන් සලකයි. ඒ සඳහා භාවිත කරන උපක්‍රමය නම් පිරිත් පැන් කළය සමග පිරිත් මණ්ඩපයේ ඇති පූජ්‍ය වස්තු සමග පිරිත් හුයක් සම්බන්ධ කිරීම ය. ''තනාගත් මණ්ඩපය වටා පිරිත්හුය අදිති. කපගස ඇතුළු වන සේ අදිනු ලබන පිරිත්හුය ධාතු කරඬුව-පිරිත් පොත-කපගස මෙන් ම පිරිත් කළයට ද සම්බන්ධ කිරීම ඉතා වැදගත් කොට සැලකිය යුත්තකි''(පඤ්ඤාතිස්ස හිමි 1992:138). මේ පිරිත් හුය පිරිත් ශ්‍රවණය කරන ජනයා විසින් අල්ලාගෙන සිටීම ද සිරිතකි. බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් වැඩසිටින පිරිත් මණ්ඩපය තාවකාලික විහාරස්ථානයක ස්වරූපයක් ගනී. සධාතුක කරඬුව බුදුන්වහන්සේ සංකේත කරයි; පිරිත් පොත උන්වහන්සේගේ ශ්‍රී සද්ධර්මය සංකේත කරයි; පිරිත් දේශනා කරන භික්ෂූන්වහන්සේලා මහා සංඝරත්නය ද සංකේතවත් කරයි. මේ සියල්ල සම්බන්ධ කෙරෙන පිරිත් හුය ඔස්සේ දේශනා කරන පිරිතෙහි බලය ගමන් කරන බවත් එය අල්ලාගෙන පිරිත් ශ්‍රවණය කරන පිරිසට එයින් ශාන්තිය සැලසෙන බවත් විශ්වාස කරන ජනයා හුය සම්බන්ධ වන පැන් කළයට ද ඒ බලය ආරෝපණය වන බව විශ්වාස කරයි. මේ අනුව පිරිත් පැන් පානය කිරීමෙන් අමනුෂ්‍ය දෝෂ, රෝගාබාධ, අපල උපද්‍රව ආදිය සුව වන බව ඔවුන්ගේ විශ්වාසයි. ජලය සම්බන්ධ ආගමික පිළිවෙතක් වූ ජලනන්දන නම් පිරිත් විශේෂය ලක්ෂ වාරයක් දේශනා කිරීමේදී භාජනයෙන් ජලය උතුරා යතැ'යි ද ඒ ජලය රෝගීන් සුව කිරීමට දිව ඔසුවක් වෙතැ'යි ද සැලකේ (සිළුමිණ දෙසැ.1994: 15).

ජීවිතයේ අර්බුදකාරී අවස්ථාවල දී සහනය පතා පැවැත්වෙන බෝධිපූජාවල දී ද කළය අනිවාර්යයෙන් භාවිත වේ. සිද්ධාර්ථ ගෞතමයන්ට බුද්ධත්වය හෙවත් ප්‍රඥාවබෝධය ලබා ගැනීම සඳහා සෙවණ සැලසුණු ඇසතු වෘක්ෂය 'බෝධි' වෘක්ෂය වශයෙන් හැඳින්වේ. සෑම බෝධි වෘක්ෂයක් ම, බෝසතුන්ට සෙවණ දුන් බෝධි වෘක්ෂයේ පරපුරට අයත් කොට සලකා වන්දනාමාන කිරීමේ සම්ප්‍රදායයක් මෙරට ඇති විය. එහි ප්‍රභවයට පදනම් වන්නට ඇත්තේ බෝධි වෘක්ෂයක් රෝපණය කළ පසු එය නොනැසී පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය පෝෂණය හා ආරක්ෂාව පෙරදැරි කරගත් වතාවත් පද්ධතිය බව නිසැක ය. නැවුම් කළයකට පිරවූ ජලයෙන් බෝධිය නැහැවීම බෝධිපූජාව හා සම්බන්ධ චාරිත්‍රවල ප්‍රමුඛ කාර්යයකි. දක්ෂිණාවෘත ව බෝධිය වටා සත්වරක් ගමන් කොට අවසානයේ බෝධිය මුලට ජලය වත් කිරීම වර්තමානයේ ද දැකිය හැකි ය. මේ පූජා විධි විවිධ ආකාරයෙන් සිදු කිරීමට ජනයා පුරුදු වී සිටී. ඇතැම් විට ජලය වෙනුවට කිරි ද පූජා කර තිබේ. කළ සතකින් බෝධිය නැහැවීම මගින් අපල උපද්‍රව දුරුවීම, අරමුණු ඉෂ්ට වීම, ජීවිතයට ශාන්තියක් ලැබීම ආදී ප්‍රතිඵල අත්වන බවට ජනයා විශ්වාස කරයි.

පුද්ගලයන්ට හෝ ගහකොළට හෝ ඇතිවන බවට විශ්වාස කෙරෙන ඇස්වහ, කටවහ හෝවහ වැනි දෝෂ හරණය සඳහා අනුගමනය කෙරෙන ඇතැම් අභිචාරාත්මක ක්‍රමවල දී ද කළය උපයෝගී කරගැනේ. ''ඇස්වහ කටවහ ආදියට කරන එක්තරා කෙමක් ඇත. එනම් උදෙන් ම කිසිවකු හා කථා කිරීමට කලින් නැවුම් මැටි කළයකට ළිඳකින් ගත් ජලය මන්ත්‍රකරුවන් ලවා දෙහි අත්තකින් මතුරවා දෙතුන් දිනක් හෝ අත, කට, මුහුණ සේදීම ය''(උදිතනායක හිමි 1981:258). සාර්ථක ඵලදාවක් අපේක්ෂා කරන ගොවීන්, තමා වගා කරන භවභෝග ඇස්වහ කටවහ දෝෂවලින් ආරක්ෂා කරගැනීම සඳහා තම ගොවිපලේ මැද දිග රිටක් සිටුවා, පිටත හුණු රේඛාවලින් විසුළු මුහුණක් අඳින ලද විශාල මැටි කළයක් එහි මුදුනේ රඳවා තැබීම වර්තමානයේ පවා ගැමි ප්‍රදේශවල සිදු කෙරෙන්නකි. ඒ අසලින් යන එන අයගේ අක්ෂි දෘෂ්ටිය එක එල්ලේ ගොවිපලෙහි ඇති භවභෝග කෙරෙහි යොමු වීම ඉන් වැළකේ. පළමුවෙන් ම අක්ෂි දෘෂ්ටිය යොමුවන්නේ විසුළු මුහුණ සහිත කළය වෙතට ය. එය ඇස ගැටෙන විට, බලන්නාට හාස්‍යය ඇතිවීම නිසා ඇස්වහ කටවහ

දෝෂ හට නොගන්නා බව ගැමි විශ්වාසයයි. පිදුරුවලින් පඹයන් බැඳ හිසට එවැනි කළයක් සවිකිරීම ද සිදු වේ.

විවිධ ලෙඩරෝග හා අපල උපද්‍රව ආදියෙන් ශාන්තිය පතාත් ජීවිතයේ ඇතැම් වැදගත් කාර්යවල සාර්ථකත්වය හා ජයග්‍රහණය පතාත් දෙවියන්ට යම් යම් දේ පූජා කිරීම සඳහා බාරවීමේ සිරිත සිංහල ජනසමාජයේ පැවතෙන්නකි. තම අරමුණ ඉටු වූ පසු පොරොන්දු වූ ද්‍රව්‍ය දෙවියන් වෙත පූජා කරන බවට ප්‍රතිඥා දීම හෙවත් ගිවිස ගැනීම බාරවීමක දී සිදු වේ. රූපයට රූපයක් බාරවීම, පාත්‍රා, මල්වට්ටි හා පහන් ප්‍රමාණයක් දල්වීමට බාරවීම මෙන් ම කිරිබත් හා කිරිකළවලින් බාරවීම ද මෙහි දී දක්නට ලැබීම විශේෂත්වයකි (උදිතනායක හිමි 1981:292). ඒ අනුව එහි දී ද කළය ප්‍රයෝජනයට ගැනීම දැකිය හැකි ය.

රටයකුම හෙවත් රිද්දි යාගය නම් ශාන්තිකර්මයේ දී ද කළය භාවිත වේ. මෙහි දී තම භාර්යාව ගර්භනී තත්වයට පාත්‍ර වී ඇති බව දැනගන්නා ස්වාමිපුරුෂයා විසින් නැවුම් කළයක් ගොක්කොළවලින් සරසා එයට ජලය, පඬුරු, ලදපස්මල්, බාඳුරා වැල් කැබැල්ලක් ආදිය බහා ගෙයි වහළයේ එල්ලා තැබේ. මේ ක්‍රියාව හැඳින්වීමට 'කලහක් වෙන් කිරීම', 'කලහ තැබීම' (කාරියවසම් 1976:42) යන විශේෂ යෙදුම් ව්‍යවහාර වේ. කිසිදු උපද්‍රවයකින් තොරව දරු උපත සිදු වූ විට රටයකුම ශාන්තිකර්මය පවත්වා ඒ කළය බිඳින බවට ඇපවීම මින් අදහස් කෙරේ. විශේෂයෙන් ම කුළුඳුල් දරු උපතක දී පස්වෙනි මාසයේ දී හා සත්වෙනි මාසයේ දී මේ සිරිත අනුගමනය කෙරේ. ''දරුවා නිරුපද්‍රිත ව බිහිවුණු වහාම බිඳීමේ ප්‍රතිඥාව මත මතුරනු ලැබූ කළය ගැබිනිය කිරිගහක් අසලක දී බිඳියි'' (මහවැලි වංශය 185:379).

කළුයක් නැටීමේ දී ද කළය බිඳීමේ පිළිවෙතක් අනුගමන කෙරේ. දරුවා ලැබීමට පෙර හෝ ඉපදී බත් කැවීමේ දිනයට පෙර හෝ එය සිදු කෙරේ. මෙහි දී කළුයක් මඬුවක් සාදා රෑ පුරා කළුයක් නැටුම නැටීම සිදු කොට රෑ පහන් වූ පසු කළය බිඳීම සිරිත ය. මේ ශාන්තිකර්මයේ දී කළය භාවිත වන්නේ ප්‍රබල සංකේතාර්ථයකිනි. කළයෙන් සංකේතවත් කෙරෙන්නේ කාන්තාවකගේ දරුගැබයි. එය

දරුවා ලැබුණු පසු බිඳීමෙන් සංකේතවත් වන්නේ නිරුපද්‍රිත ව දරුවා බිහිවීම යි.

බලියාගවල දී බලි ඇඹීම සඳහා සාදාගැනෙන බලිමඬුවෙහි පවිත්‍රතාව ආරක්ෂා කිරීමේ විධික්‍රමවල දී ද කළය උපයෝගී කර ගැනිණි. එහි දී නැවුම් ළිඳකින් නැවුම් කළයකට ගත් ජලය සමග නොයෙකුත් ඖෂධ වර්ග හා කහදියර මිශ්‍ර කර කවි ගායනා කරමින් බලිමඬුව පුරා ඉසීම සිදු කෙරේ (කාරියවසම් 1979: 41). කහ දියර වනාහී විෂ නාශක ගුණයක් සහිත ශුද්ධත්වය පතා ඉසිනු ලැබෙන්නකි. නැවුම් මැටි කළයේ ජලයට කහදියර එක්වීම මගින් පාරිශුද්ධත්වය වඩාත් තීව්‍ර කෙරේ. පවිත්‍රතාව, සෞඛ්‍ය සම්පන්නභාවයට අත්‍යවශ්‍ය සාධකයකි. එබැවින් මෙහි දී පවිත්‍ර ජලය, කහ දියර හා නැවුම් කළය උපයෝගී කරගැනීම වඩාත් අර්ථාන්විත ය.

සාම්ප්‍රදායික ජනඇදහිලි හා විශ්වාස පද්ධතියෙහි භෛරවයන් පිළිබඳ විශ්වාසය පදනම් කරගැනුණු වත්පිළිවෙත්වල දී ද කළය විශේෂයෙන් භාවිත කෙරේ. භෛරවයන් වනාහී පොළොව යට තැන්පත් කර ඇති රන්, රිදී, මුතු, මැණික් ආදි වස්තුවලට හා ඉඩකඩම් ආදියට අධිගෘහීත දේවතා කොට්ඨාසයක් ලෙස සැලකේ. ඔවුන් උදෙසා පූජා පැවැත්වීමකින් තොර ව නිවෙස් ඉදිකිරීමේ දී විවිධ බාධා හා ප්‍රමාද ඇතිවෙතැ'යි ද, මැණික් ගැරීමේදී මේ පූජාව නොකිරීමෙන් කෙතරම් මුදල් වැය කළ ද මැණික් ලාභ හිමි නොවෙතැ'යි යන්න ද ගැමි විශ්වාසය යි. භෛරව පූජාවේ දී භාවිත ජලකුම්භය, කළය භාවිතයෙන් සකසා ගැනෙන්නකි. පිරිසුදු කර ගත් තැනක කෙසෙල් කොළයක් එලා ඒ මත ජලය පිරවූ නැවුම් කළයක් තබා එහි කට වටේට අඹ කොළ හතක් දමා ඒ මත කහදියරෙන් සේදූ ලෙලි ගැසූ පොල් ගෙඩියක් තබා ඒ මත කපුරු පෙති තුනක් දැල්වීමෙන් ජලකුම්භය සකසා ගැනේ. ඒ කළය වටා පහන් සතරක්, මල්, සුවඳ දුම් ආදිය තබා නියමිත ශ්ලෝක ගයමින් පූජා කටයුතු සිදු කෙරෙයි. අනතුරුව කළය ගෙන උස් ස්ථානයක සුරක්ෂිත ව තබා, පසුදා අලුයම කතා නොකර, එහි පැනින් මුහුණ සෝදා ස්වල්පයක් පානය කොට ඉතිරි ජලය නිවස ඉදිකෙරෙන ස්ථානයට හෝ මැණික් පතල හාරන ස්ථානයට ඉසිය යුතු වෙයි. එවිට සියලු බාධක අවහිර ධූරිභූත වී යනු ඇතැ'යි විශ්වාස කෙරේ.

මෙය, කළය පොළොව මෙන් ද අඹ කොළ හත සත් පත්තිනි දෙවියන්ගේ බලය මෙන් ද, පොල්ගෙඩිය ලොව පහළවීම මෙන් ද, කපුරු පෙති තුන බ්‍රහ්ම-විෂ්ණු-මහේශ්වර යන ත්‍රිමූර්තිය මෙන් ද සංකේතාර්ථයෙන් ගෙන සලකා කරන පූජාවක් බව කියැවෙයි (බණ්ඩාරගම 1990:27).

බාලිකාවන් මුල් කරගෙන පැවැත්වෙන ප්‍රධාන මංගල්‍ය අවස්ථාව ලෙස දැක්විය හැකි 'මල්වර මංගල්‍යය', 'කොටහළු මංගල්‍යය' නමින් ද හැඳින්වේ. 'වැඩිවිය පැමිණීම', 'ලොකුවීම' වැනි නම්වලින් හැඳින්වෙන මේ අවස්ථාව ජීව විද්‍යාත්මක ව සැලකෙන්නේ ස්ත්‍රියක පරිණත භාවයට පත්වීමේ අවස්ථාව වශයෙනි. මෙය ජීවිතයේ දෙවන උග්‍ර අවස්ථාව ලෙස සලකන සමාජ විද්‍යාඥයෝ තාරුණ්‍යයේ හිමිදිරියත්, වියපත්වීමේ උදාවත් ලෙස ද හඳුන්වති (පෙරේරා 1993:1). විද්‍යාත්මක තත්වයන් පිළිබඳ අවබෝධයෙන් තොර වුව ද ගැමියන් විසින් දැරිවියක වැඩිවිය පැමිණීම කෙරෙහි විශේෂ අවධානය යොමු කොට ක්‍රියා කරනු ලැබ තිබේ. ස්ත්‍රියකගේ මේ වැදගත් අවස්ථාව දැනගත් තැන් පටන් අනුගමනය කෙරෙන චාරිත්‍ර වාරිත්‍ර රාශියකි. මුලින් ම දැරිවියගේ දෙමව්පියන් විසින් නැකැත්කරුවකු වෙත ගොස් ඇගේ අනාගතයට මල්වර වීම බලපාන ආකාරය පිළිබඳ ව විමසා බැලේ. ඒ සමග දැරිය නැහැවීමට හා දොරට වැඩීමට අදාළ නැකත් සෑදීම ද සිදු කෙරේ.

මල්වර මංගල්‍යයේ දී කළය සම්බන්ධ වන්නේ මල්වර දැරිය නැහැවීමේ චාරිත්‍රයේ දී ය. කුමන අපවිත්‍ර දෙයක් වුව ද පවිත්‍රකරණයේ දී ජලය අත්‍යවශ්‍ය ය. ජලය පවිත්‍රත්වයේ මෙන් ම සශ්‍රීකත්වයේ ද සංකේතයකි. මල්වර දැරිය නැහැවීමේදී වෙනත් භාජනයක් භාවිත කළහැකි වුවත් කළය ම යොදාගැනීමට හේතුව ජලය පිරි කළය මගින් සශ්‍රීකත්වය, සෞභාග්‍යය හා පරිපූර්ණභාවය සංකේත වීම නිසා ය. මල්වර වූ දැරිය නිවසේ විශේෂ ස්ථානයක රඳවා තැබේ. දැරිය අසල පුබුදුවන ලද පොල්මලක් බහාලන කළයක් තැබේ. සමහර ප්‍රදේශවල කළයට කාසි දැමීම ද සිදු කෙරේ. කොටහළු උපත නම් කාව්‍යයෙහි මේ චාරිත්‍රය පිළිබඳ සඳහන් වේ (ප්‍රේමතිලක 1986:12). එසේ දැමෙන පොල්මලේ ඇට්ටි සංඛ්‍යාව ඔත්තේ නම් දැරියගේ අනාගතය සුබ බවත් ඉරට්ටේ සංඛ්‍යාවක් නම් එය

අවාසනාවන්ත බවත් සැලකේ. ඔත්තේ සංඛ්‍යාවකින් ඇඟවෙන්නේ ඉතිරියකි; ඉරට්ටේ සංඛ්‍යාවකින් ඇඟවෙන්නේ ශූන්‍යයකි. නැකැත්කරුගේ උපදෙස් පරිදි නියමිත දිනයෙහි දැරිය නැහැවීම සඳහා නිවසට නුදුරින් කිරිගසක් යට හෝ කිරිගසක අත්තක් සිටුවා සකසා ගත් අතුමඬුවක හෝ කටයුතු සූදානම් කෙරේ. නැකැත් දින සුබ හෝරාවෙන් සුදු වස්ත්‍රයකින් දැරියගේ හිස සිට දෙපතුළ දක්වා වසාගෙන මව හෝ නැන්දණිය හෝ රජක ස්ත්‍රිය හෝ එම රහස් ස්ථානයට කැඳවාගෙන එනු ලැබෙයි. ශුභ නැකතට අනුව අදාළ දිශාවට මුහුණ ලා, කලින් සූදානම් කරගන්නා ලද අගිල්, සඳුන්, මානෙල්, සපුමල් වැනි සුවඳ ද්‍රව්‍ය මුසු කළ නැවුම් දිය කළයකින් හෝ කිරිකළයකින් දැරිය නැහැවෙයි. වයඹ පළාතේ මේ සඳහා යොදා ගනු ලබන්නේ අලුත් ළිඳකින් ලබාගත් නුමුහුන් (අමිශ්‍ර) ජලයයි. දැරිය නැහැවීමේ චාරිත්‍රය අවසන් වූ විගස කළය ඇගේ හිස වටා කරකවා බිඳ දමන්නේ සියලු වස්දොස් දුරැලීමට ය (පෙරේරා 1993:5). එලෙස මල්වර දැරිය නැහැවීමේ චාරිත්‍රයේ දී කළය බිඳීමෙන් සංකේත කරන්නේ අලුත් ජීවිතයතයකට අවතීර්ණ වන දැරියගේ පෙරමග පවිත්‍ර කිරීමකි. කළය බිඳීමත් සමග වස්දොස් දුරුවන බවට වූ විශ්වාසය මේ සිරිතට පදනම් වන්නට ඇත.

ගැහැනු දරුවකුගේ ජීවිතය ළමා වියේ සිට යොවුන් විය දක්වා පරිවර්තනය වන සංක්‍රාන්තිය සංකේතවත් කෙරෙන කඩුල්ල පැනීම නම් චාරිත්‍රය සඳහා ද කළය භාවිත කෙරේ. දැරිය නියමිත නැකතට කඩුල්ල පැන කිරිගස දෙස බලන අතරේ මව හෝ පවුලේ වැඩිහිටි කාන්තාවක හෝ විසින් ඇගේ උකුළ මත තැබෙන දිය පිරි කළය රැගෙන ගමන් කළ යුතු වේ. මේ චාරිත්‍රයේ අරමුණ, යොවුන් වියට පත් දැරියට අනාගතයේ ගෘහණියක ලෙස ඉටු කිරීමට සිදු වන කාර්යභාරය පිළිබඳ හැඟීමක් ලබා දීම විය හැකිය. එසේ ම සියලු වස් දොස් දුරු වී ඇගේ අනාගතයට සෞභාග්‍යය උදාකරවන අදහස ද මෙහි ගැබ්ව ඇත.

විවාහ මංගල්‍යයක දී වැදගත්ම අවස්ථාව වන පෝරුවේ චාරිත්‍ර විධිවල දී ද කළය භාවිත වේ. මනාලිය කැන්දාගෙන ඒමේ දී මනාල පාර්ශ්වය විසින් ඉටු කරන චාරිත්‍රවල දී කළයේ භාවිතය අනිවාර්ය වී ඇත. මනාල යුවල මනාලයාගේ නිවෙසට සම්ප්‍රාප්ත

වන විට ඉදිරි පස දොරකඩ සිට මනාලයාගේ නැන්දණියක විසින් මනාලිය පිළිගනු ලැබෙන්නේ දිය පිරි නැවුම් කළයක් ඇගේ උකුළ මත තබමින් සහ අනෙක් අතට තැඹිලි පැලයක් දීමෙනි. මෙයින් සංකේත වන්නේ මනාලියට ගෘහ කටයුතු පැවරීමකි. ඒ සඳහා දිය පිරි කළය යොදා ගෙන ඇත්තේ ජීවිතයේ සාර්ථකත්වය අපේක්ෂාවෙනි.

රජවරුන්, මැති ඇමතිවරුන්, ප්‍රභූවරුන් සහ භික්ෂූන්වහන්සේලා අභාවප්‍රාප්ත වූ පසු මෘත ශරීර පෙරහැරින් රැගෙන ගොස් ආදාහනය කිරීම දුරාතීතයේ පටන් ම සිදුවූවකි. මහනුවර රජසමයේ රජකෙනෙකුගේ ආදාහන කටයුතු පිළිබඳ තොරතුරු දැක්වෙන විස්තරයක කළයේ භාවිතය පිළිබඳ ව සඳහන් වේ. ''ශේෂ වී ඇති අළු ගොඩින් ඇට කැබලි කීපයක් කළයක දමා කට බැඳ පසෙක තබති. කළු ඇඳුම් ඇඳ, මුහුණ වසාගත් මිනිසෙකු ඇතෙකුගේ හෝ අසකුගේ පිට නංවා කඩුවක් හා කළයෙහි දැමූ ඇට ද ඔහු අතට දී අමාත්‍යාදීන්ගෙන් සැදි පෙරහැරකින් මහවැලි ගඟේ කටුගස්තොටට ගෙන යති. එහි දී ඔරුවක නංවනු ලැබූ ඔහු ගඟ මැදදී කඩුවෙන් කළය දෙපළු කොට ගඟට දමා පීනා එතරට යති'' (පඤ්ඤාතිස්ස හිමි 1992:72). ජෝන් ඩේවිගේ විස්තරයකින් ද ආදාහන චාරිත්‍ර වාරිත්‍රවල දී කළය භාවිත කෙරුණු ආකාරය හැඳිනගත හැකි ය. '' මළ සිරුර දැවුණු විට.... අළු මැටි බඳුනකට දමාගෙන ගොස් යම් විහාරයක් අසල හෝ පවුලේ සුසාන භූමියේ හෝ තැන්පත් කරති''(සෝමරත්න 1967:151). මිය ගිය පුද්ගලයාට ගරු කිරීමක් ලෙස සිදු කෙරෙන, මෘත ශරීර ආදාහනය කිරීමෙන් පසු භෂ්මාවශේෂ තැන්පත් කොට ස්මාරක ඉදිකිරීම වර්තමානයේ පවා සිදුවන්නකි. එහි දී භෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා ඊට ඔබින ආකාරයෙන් සාදන ලද කළ විශේෂයක් අතීතයේ භාවිත කර ඇති බවට පොම්පරිප්පු සුසාන භූමියෙන් හමු වී ඇති මෙගලිතික අවධියට අයත් බවට සැලකෙන ඉපැරණි ම කළයක හැඩැති භාජන (Deraniyagala 1981:10) ප්‍රබල සාක්ෂ්‍යයකි. 'මිනී අළු' නමින් ව්‍යවහාර කෙරෙන මෘත ශරීර දැවීමෙන් ශේෂ වන භෂ්ම, නොයෙකුත් අණ වින, හදි හූනියම් සඳහා යොදා ගත හැකි භයානක ද්‍රව්‍යයක් බව ගැමි විශ්වාසයයි. එවැනි භයංකර ද්‍රව්‍යයක් දැමීම සඳහා මුව විශාල මුට්ටියක්, වළඳක් වැනි බඳුනකට වඩා මුව කුඩා බඳ විශාල

කළය මනාව ගැළපුණි. මිනී අළු දමා කළයෙහි මුව වැසෙන සේ රෙදි කඩකින් බැඳ දැමූ විට ඒවා මනාව ආරක්ෂා වේ. මිනී අළු තැන්පත් කොට ස්මාරක ඉදිකිරීම සිදුකෙරුණේ ප්‍රභූවරුන් හෝ වත්පොහොසත්කම් සහිත පුද්ගලයින් හෝ අතර ය. බොහෝ විට ගඟකට හෝ මුහුදට හෝ මිනී අළු දමා පා කර හැරීම සිරිත ය. එසේ ම මිනී අළු සහිත කළය සිදුරු කොට දියට දැමීම ද සිදු කර ඇත.

සරල ජීවන රටාවකට අනුගත ව සිටි අතීත ජනයා විසින් තම පවුල් ඒකකයේ අවශ්‍යතා හා සැසඳෙන පරිදි තනාගැනුණු නව නිවහනක ජීවත්වීම ආරම්භ කරනු ලැබුණේ ජ්‍යොතිෂ ශාස්ත්‍රානුකූල ශුභ මුහුර්තයකට හා ඊට අදාළ වූ චාරිත්‍ර වාරිත්‍ර මාලාවකට අනුව ය. එවැනි අවස්ථාවල දී ගෘහණිය විසින් දිය පිරූ අලුත් කළයක් රැ ගෙන ගෘහයට පිවිසීම සිදු ව ඇත (ශ්‍රී සඟරාව අගොස්තු 1966:31). වර්තමානයේ පවා ගැමි ප්‍රදේශවල ගෘහ ප්‍රවේශ අවස්ථාවල දැකිය හැකි මේ චාරිත්‍රයෙහි අර්ථය වන්නේ නව නිවසට සශ්‍රීකත්වය හා සෞභාග්‍යය කැඳවීම ය.

සූර්යයා මූලික කරගෙන සෑම වසරක ම බක් මාසයේ පැවැත්වෙන අලුත් අවුරුදු උත්සවය නිමිති කොට ගෙන ගැමි නිවෙස්වලට අලුතින් ගෙනෙන බඩුමුට්ටු අතරට මැටි කළය ද අනිවාර්ය විය. සෞභාග්‍යය, සශ්‍රීකත්වය සංකේත කෙරෙන කළය අලුතින් නිවසට එක්වීම සුභ කරුණක් විය. අලුත් අවුරුද්දේ අලුත් කළයකින් දිය ගෙනැවිත් පානය කිරීම අලුත් ජීවිතයක සුබ ඇරඹුමක් සේ සැලකිණි. ජ්‍යොතිෂ ශාස්ත්‍රයට අනුව සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට සංක්‍රමණය වීම අලුත් අවුරුද්දේ උදාව වශයෙන් සැලකේ. අවුරුදු උදාවත් සමග වැඩ ආරම්භ කිරීම, ගනුදෙනු කිරීම, ආහාර අනුභවය ආදී පොදු ක්‍රියාකාරකම් සමූහයක් පවතී. එක් එක් ප්‍රදේශවලට අනුව ඒවායේ විවිධතා දැකිය හැකි ය. ගනුදෙනු කිරීමේ චාරිත්‍රයේ දී බොහෝ ප්‍රදේශවල ළිඳ සමග ගනුදෙනු කිරීම වර්තමානයේ පවා සිදු වේ. මෙය සිදු කරන්නේ නිවසේ ගෘහණිය විසින් වීම විශේෂත්වයකි. අලුත් අවුරුද්ද උදා වූ මොහොතේ ළිඳ ඉඳුල් කිරීම නමින් චාරිත්‍රයක් වේ. ගත වී ගිය අවුරුද්දේ නියමිත වේලාවට ළිඳෙන් ගෙනා දිය කළයෙන් පංගුවක් භාජනයක දමා වහලේ එල්ලා තැබීම හෝ ප්‍රවේශම් කොට තැබීම සිංහලයන්ගේ සිරිත ය. අලුත් අවුරුද්ද උදා වූ අවස්ථාවේ ඒ දිය ටික ගෙන ගොස් ළිඳට හලා අලුත්

කළයකින් දිය ගෙන ඒම මේ චාරිත්‍රය අනුව සිදු කෙරෙන ක්‍රියාවලියයි. ඒ අවස්ථාවේ කාසියක් ද කැවුම් කිරිබත් ආදිය ද කුඩා පොට්ටනියක බැඳ ළිඳට දැමීම ද සිදුව ඇත (විමලවංශ හිමි 1964:682). මේ සිරිත් වර්තමානයේ ද ගැමි පෙදෙස්වල දැකිය හැකි ය.

ගොයම් කැපීම හා මැඩවීම වැනි ගොවිතැන් කටයුතු කෙරෙන අවස්ථාවල වෙහෙස නිවාගැනීම පිණිස ගැමි ජනයා කවි ගායන, නර්තන හා වාදන වැනි විනෝද කාර්යයන්හි යෙදුණු අවස්ථාවල කළය වාද්‍ය භාණ්ඩයක් ලෙස භාවිතයට ගෙන තිබීම ද විශේෂ කරුණකි. කළය බෙර කඳ ලෙස ගෙන එහි මුවෙහි යමක් ඇලවීමෙන් තනා ගැනුණු තූර්යභාණ්ඩය 'බුම්මැණ්ඩිය' (සේදරමන් 1962:42) නමින් මෙන්ම 'කුම්භ බෙරය' (විමලවංශ හිමි 1964: 564) යනුවෙන් ද ව්‍යවහාර වී ඇත. දේශීය නර්තන කලාවේ එන පංචතාලයට අයත් 'කුම්භතාලය' (විජේවර්ධන 1994: 94) ද කළය වාද්‍ය භාණ්ඩයක් ලෙස භාවිතය හා සම්බන්ධිත තාල විශේෂයකි.

ජනක්‍රීඩාවක් මෙන් ම ජන නැටුමක් වශයෙන් ද සිංහල ජන සමාජයෙහි ප්‍රකට කළගෙඩි නැටුම කළගෙඩිය සම්බන්ධ ප්‍රධානතම විනෝදාත්මක කාර්යයකි. මහනුවර සමයේ ආලත්ති ගැහැනුන් හෙවත් නර්තනය හා ගායනය පිණිස වූ ස්ත්‍රීන් කාණ්ඩායමේ ප්‍රියතම ක්‍රීඩාවක් නම් අලුත් කළගෙඩි ගෙන නටන 'කළගෙඩි නැටුම' ය (කුමාරස්වාමි 1962:218). මෙය කාන්තාවන් විසින් රඟ දැක්වෙන්නක් ලෙස ප්‍රකට වුව ද කාන්තා වෙස් ගත් පිරිමින් විසින් ද අතීතයේ රඟ දක්වුණු බව පැවසේ (මහවැලි වංශය 1986:477). මහනුවර සමයේ දී විහාර, දේවාල ආදියෙහි තේවා කටයුතු සඳහා කළගෙඩි නැටුමේ නිරත වූ කාන්තාවන් සිටි බව රොබට් නොක්ස් ද සඳහන් කරයි (කරුණාරත්න 1992:245). පෙරහැරවල දී ඊට එකතු වන අංගයක් ලෙස කළගෙඩි නැටුම ද විය (විමලවංශ හිමි 1964:615). 'කළගෙඩි මාලේ' නැතහොත් 'කළ ගෙඩි පිඹීම' යන පද්‍ය කෘතියට අනුව කළය ජන නැටුම් සමග ද විශේෂ සම්බන්ධතාවක් පැවැත්වූ ආකාරය හඳුනාගත හැකි ය. 'කළගෙඩි මාලය' සහ 'කළගෙඩි පිඹීම' (Nevil 1954: 61) යන යෙදුම්වලින් හැඳින්වෙන්නේ කළය උපයෝගී කරගත් ප්‍රකට ජන නැටුම් විශේෂයයි. කළගෙඩි නැටුම රඟ දැක්වීමේදී ගැයෙන පද්‍යයක 'අම්මාවරු' යන යෙදුමෙන් ඇඟවෙන්නේ පත්තිනි දෙවියන් බව පෙනී යයි;

සුම්මා කළගෙඩි දෑතට ගත්තු
අම්මාවරු නැටුමට සිට ගත්තු
(සෝමානන්ද හිමි 1997:588)

කළය වැඩියෙන් ම සම්බන්ධ වූයේ කාන්තාව සමග බැවින් කාන්තාව සහ කළය එක්තැන් වූ කළගෙඩි නැටුම චිත්තාකර්ෂණීය විය. මේ නැටුම සඳහා භාවිත කෙරුණු කළගෙඩි, සාමාන්‍යයෙන් භාවිත වන කළගෙඩිවලට වඩා ප්‍රමාණයෙන් කුඩා විය (කුමාරස්වාමි 1962:218).

මෙය විදේශික අමුත්තන් පිනවීම සඳහා ද රඟ දැක්වා ඇත;

වට පිට සිට අපෙ සෙල්ලම් බලනා
රට රට වල පුම ඉතිරින් සොබනා
(සෝමානන්ද හිමි 1997: 597)

කළගෙඩි නැටුම නැරඹීමෙන් ඉමහත් ආස්වාදයක් ලැබූ පෘතුගීසී ධර්ම දූතයකු වන බල්දියෙස් ද එහි ඇති සුන්දරත්වය පිළිබඳ ව සටහන් තබා ඇත (1960: 36).

මේ ආකාරයට කළය යනු නානාවිධ භෞතික හා අභෞතික ප්‍රයෝජන රාශියක් සලසන ජනජීවිතය සමග අවියෝජනීය සම්බන්ධතාවක් දක්වන සුවිශේෂ මෙවලමකි. වර්තමානයේ පවා ග්‍රාමීය ප්‍රදේශවල මැටි කළයට ප්‍රමුඛස්ථානයක් තිබුණ ද, මැටි වෙනුවට ලෝහ, ප්ලාස්ටික් වැනි අමුද්‍රව්‍ය උපයෝගී කරගෙන නිපදවෙන කළ භාවිතයට ජනයා වැඩි නැඹුරුවක් දක්වයි. එහෙත් එවැනි කෘත්‍රිම අමුද්‍රව්‍යන්ගෙන් නිපදවෙන කළවලින්, මැටි කළයකින් සැලසුණු ප්‍රයෝජනය, නොසැලසෙන බව ඔවුන් වටහා නොගැනීම කුඹල් කර්මාන්තයේ පරිහානිය කෙරෙහි ද බලපා තිබේ.


ආශ්‍රිත ග්‍රන්ථ:

1. De Silva, Nimal and Dissanayaka, Ranjith Bandara 2008, **A Catalogue of Anciant Pottery from Sri Lanka**, Postgraduate Institute of Archaeology: Colombo
2. Skibo, James M. and Feinman, Gary M.1999, **Pottery and People**, The University of UTAH Press:Salt Lake City

3. කුමාරස්වාමි ආනන්ද 1962, **මධ්‍යකාලීන සිංහල කලා** (පරි.) එච්. එම්. සෝමරත්න, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ
4. **මහාවංසය** 1 1996, (පරි.) ශ්‍රී සුමංගල හිමි සහ ද සිල්වා, දොන් අන්ද්‍රිස් බටුවන්තුඩාවේ. නුගේගොඩ: දීපානි ප්‍රකාශන
5. **සිංහල බෝධිවංශය** 1970, (සංස්.) ඩී.පී. ආර්. සමරනායක, ගුණසේන: කොළඹ
6. **සිංහල මිලින්ද ප්‍රශ්නය** 1970:62 (සංස්.) ගලගම පණ්ඩිත ශරණංකර හිමි, කොළඹ
7. ධම්මරතන හිමි, කේ. 1880,(සංස්.) **විසුද්ධි මාර්ග සන්නය** -1 කාණ්ඩය, කොළඹ
8. දහම්පියා අටුවා ගැටපදය 1967 (සංස්.) විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ සහ සෝමින්දර හිමි, නැහින්නේ., කොළඹ: ගුණසේන
9. Ryon 1953, **Caste in Modern Ceylon**, Rutgers University Press: New Brunswick
10. පීරිස්, රැල්ෆ් 1964, **සිංහල සමාජ සංවිධානය**,සමන් ප්‍රකාශකයෝ: කොළඹ
11. කරුණාරත්න, ඩේවිඩ් 2008, (අනුවාදක) **එදා හෙළදිව**, ගුණසේන: කොළඹ.
12. දිවයින 2014-01-19, උපාලි පුවත්පත්: කොළඹ
13. Child V. Gordon 1956, **Man Makes Himself**, Watts and Company, London
14. Plekhanov, **Georgi** 1981,**Selected Philosophical Works**, Volume 5. Progress Publishers: Moscow
**15.** **Ancient Ceylon**-No 1 1970, Department of Archaeology Sri Lanka( Colombo)
16. Silva, Roland 2004, **Conservation Practice National Contributions**, (Ed.) W.H.Wijayapala and Veranjan Kurukulasuriya, Department of Archaelogy:Colombo
17. පියසේන, කහඳගමගේ 1994, **බින්තැන්නේ ජනකවි**, කොට්ටාව
18. ගුණසෝම, ගුණසේකර 1992, **පානම්පත්තුවේ ජනකතා**, පන්නිපිටිය
19. වලිසුන්දර ඩබ්ලිව්. එම්. ආර්. 1973, **පොළොන්නරු ජනකවි**, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව: කොළඹ
20. **අමාවතුර** 1959, (සංස්.) කෝදාගොඩ ඥානාලෝක හිමි, ගුණසේන: කොළඹ
21. **බුත්සරණ** 1968 (සංස්.) ලබුගම ලංකානන්ද හිමි, ගුණසේන: කොළඹ
22. **ජාතක අටුවා ගැටපදය** 1961, (සංස්.) වැලිවිටියේ සෝරත හිමි, අභය ප්‍රකාශකයෝ: කොළඹ
23. Senevirathna, John M, 1936, **Dictionary of Proverbs**, The Times of Ceylon:Colombo
24. **ජනවංශය**-ශ්‍රී බුද්ධරක්ෂිත හිමි 2003, (සංස්.) එම්. බී. ආරියපාල සහ තවත් අය, ගොඩගේ: කොළඹ
**25.** **Epigraphia Zeylanica-** Vol.1- 3, 1972, Oxford Universty Press: London
26. **දඹදෙණි අස්න** 1917, (සංස්) රණසිංහ, ඩී. ඩී. කොළඹ
27. සෙනෙවිරත්න අනුරාධ 1997, **සංස්කෘතිය හා කලා ශිල්ප**, ප්‍රදීප ප්‍රකාශකයෝ: කොළඹ

28. චන්දන හිමි, ඔරුක්මාන්කුලමේ 1992, **නුවර කලාවියේ නිමිති**, පෙතිකඩ ප්‍රකාශන භාරයඃරත්මලාන
29. පතිරණ, හර්බට් 1990, **රුහුණු කවි**, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවඃ කොළඹ
30. **සද්ධර්මාලංකාරය** 1954 (සංස්.) ද්වීතීය ධර්මකීර්ති හිමි, ගුණසේනඃ කොළඹ
31. **සද්ධර්මරත්නාවලිය** 1971 (සංස්.) කිරිඇල්ලේ ඤාණවිමල හිමි, ගුණසේනඃ කොළඹ
32. **පන්සිය පනස් ජාතක පොත** 1927, ජිනාලංකාර මුද්‍රණ ශිල්පියෝඃ කොළඹ
33. කුමාරතුංග මුනිදාස 1963, **ගංගාරෝහණ විවරණය**, ගුණසේනඃ කොළඹ
34. **සිංහල විශ්වකෝෂය** 1989, (සංස්.) ඇස්. ඇම්. ඇපා සෙනෙවිරත්න, සංස්කෘතික දෙපාර්තමේන්තුවඃ කොළඹ
35. **මහවැලි වංශය** 1985, මහවැලි සංවර්ධන අමාත්‍යාංශයඃ කොළඹ
36. විජේසේකර, නන්දදේව 1960, **ලංකා ජනතාව**, ගුණසේනඃ කොළඹ
37. **සිංහල සිරිත් විරිත්** 2002, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවඃ කොළඹ
38. පඤ්ඤාතිස්ස හිමි 1992, **චාරිත්‍ර වාරිත්‍ර චක්‍රය**, සමයවර්ධනඃ කොළඹ
39. **සිළුමිණ**, 1994 දෙසැ., ලේක්හවුස්ඃ කොළඹ
40. උඩිතනායක හිමි, හිත්තැටියේ ශ්‍රී විමලකීර්ති 1981, **භාරතීය ධර්මශාස්ත්‍ර හා සිංහල සිරිත් විරිත්**, ගුණසේනඃ කොළඹ
41. කාරියවසම්, තිස්ස 1976, **ශාන්ති කර්ම හා සිංහල සමාජය**, ප්‍රදීප ප්‍රකාශකයෝඃ කොළඹ
42. කාරියවසම්, තිස්ස 1979, **බලියාග පිළිවෙල**, සමයවර්ධනඃ කොළඹ
43. පෙරේරා, යසංජලී දේවිකා 1993, **මල්වර සිරිත**, ගොඩගේඃ කොළඹ
44. බණ්ඩාරගම, නිමල් ප්‍රේමතිලක 1984, **කොටහළු උපත සහිත පෝරු මංගල්‍යෂ්ඨක**, දීපාලෝකඃ
45. **ඩේවි දුටු ලංකාව** 1967 අනුවාදක-සෝමරත්න, එච්.එම්., ගුණසේනඃ කොළඹ
46. **Ancient Ceylon**-No 4 1981, Department of Archaeology Sri Lanka: Colombo
47. **ශ්‍රී සඟරාව** 1966 අගොස්තු 31, ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවඃ කොළඹ
48. විමලවංශ හිමි බද්දේගම 1964, **අපේ සංස්කෘතිය**, ගුණසේනඃ කොළඹ
49. සේදරමන්, ජේ. ඊ. 1962. **උඩරට නැටුම් කලාව**, ගුණසේනඃ කොළඹ
50. විජේවර්ධන, සරත් 1994, **සිංහල තිත්තාල ක්‍රමය,** සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවඃ කොළඹ
51. ගමගේ, නිමල් ජේ. 1986, **සිංහල ජනකවියේ සාහිත්‍යමය අගය හා සංස්කෘතික ලක්ෂණ**, ජාතික පුස්තකාල සේවා මණ්ඩලයඃ කොළඹ
52. සෝමානන්ද හිමි, තෙරිපැහැ 1997, **සිංහල මාල කවි සංග්‍රහය**, ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික මණ්ඩලයඃ කොළඹ
53. Nevil, Hugh 1954. **Sinhala Verse**-Vol 1 (Ed.) by P.E.P. Deraniyagala. Nationl Museum Department: Colombo.